රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 2/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7,
1988 ජනවාරි මස 20 වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණිය හා II පන්තියේ I ශ්‍රේණිය ඒකාබද්ධ කිරීම**

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණිය හා II පන්තියේ I ශ්‍රේණිය 1987.10.20 දින සිට ඒකාබද්ධ කරනු ලැබේ. ශ්‍රී ලං.වි.සේ. අධි සංඛ්‍යා සේවක සංඛ්‍යාවේ II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම්ද එදින සිට නොකෙරේ.

2. 1987.10.20 දින වන විට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ අවු: 10 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, පහත දැක්වෙන සුදුසුකම් සපුරාලන, සේවයේ ස්ථිර කර ඇති ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ නිලධාරියෙකු, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ I ශ්‍රේණියට 1987.10.20 දින සිට හෝ නියමිත සුදුසුකම් සපුරාලන දිනයේ සිට හෝ, උසස් කරනු ලැබේ.

(අ) 1 වැනි හා 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්ව තිබීම.

(ආ) පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම හෝ අදාල විද්‍යාත්මක පර්යේෂණ ක්ෂේත්‍රයේ නියමිත පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා තිබීම.

(ඇ) උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න අවුරුදු 5 ක කාලයක් තුල නියමිත දිනයන්හිදී වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

(ඈ) උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට නියමිත දිනට පූර්වාසන්න අවුරුදු 5 ක කාලසීමාවක් තුල කර ඇති වරදක් සඳහා විනයානුකූල දඬුවමකට භාජනය නොවී තිබීම.

3. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරාලන නිලධාරීන්ගෙන් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා ලැබෙන සියළුම අයදුම්පත්, අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ මාර්ගයෙන් තම නිර්දේශ සමග මාවෙත ඉදිරිපත් කරන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනු ලැබේ.

4. II පන්තියේ I ශ්‍රේණිය සඳහා උසස් කිරීම පිණිස ඉල්ලුම්පත මීට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුයි.

Siriwardhana

( ඩී.බී.අයි.පී.එස්. සිරිවර්ධන )
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් සහ

"ඒ" ආකෘතිය (අංක. 2/88. දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 වන ඡේදය පරිදි )

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණිය හා II පන්තියේ I ශ්‍රේණිය ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

## I වන කොටස

( අයදුම්කරු විසින් සම්පූර්ණ කළ යුතුය. )

1. සම්පූර්ණ නම :-

2. තනතුර :-

3. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :-

4. ශ්‍රී ලං. වි. සේ. II පන්තියේ II ශ්‍රේණියට පත්වූ දිනය :-

5. උපන් දිනය :-

6. පහත සඳහන් විභාග වලින් ඔබ සමත් වී තිබේද යන වග; එසේ නම් විස්තර සපයන්න.

| විභාගයේ නම | සමත් වූ දිනය |
|---|---|
| (අ) I වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය :- | |
| (ආ) 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය :- | |

7. වෘත්තිය සුදුසුකම් පිළිබඳ විස්තර හා/හෝ අදාල පර්යේෂණ ක්ෂේත්‍රයෙහි හදාරා ඇති නියමිත අභ්‍යාස පාඨමාලා පිළිබඳ විස්තර දින සහිතව :-

8. තනතුරෙහි ස්ථිර කර තිබේද? එසේ නම් විස්තර සපයන්න :-

9. දැනට ලබන වාර්ෂික වැටුප :-

10. පසුගිය පස් වසර තුල සියළුම වැටුප් වර්ධක ඔබ උපයාගෙන තිබේද? :-

11. උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට පූර්වයෙන් වූ පස් අවුරුදු කාලය තුල සිදු කරන ලද යම් වරදක් සඳහා ඔබ විනයානුකූල දඬුවමකට භාජනය වී තිබේද යන වග :-

12. II පන්තියේ I ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඉල්ලුම් කරන දිනය :-

13. 12 වැනි ඡේදයේ සඳහන් පරිදි ශ්‍රී ලං.වි.සේ. II පන්තියේ I ශ්‍රේණියට ......... දින සිට උසස්වීම් ලැබීමට මට හිමිකම් ඇති බවත් ඉහත 1 - 12 දක්වා ඡේද වල සඳහන් තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි බවත් ප්‍රකාශ කරමි.

........................

ඉල්ලුම්කරුගේ අත්සන:

දිනය :-

## II වන කොටස

## දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

............................................................ මහතා /මහත්මිය/මෙනෙවිය ශ්‍රී
මෙම ආකෘතියේ සපයා ඇති තොරතුරු පරීක්ෂා කළ බවත්, ඒවා නිවැරදි බවත් මම සහතික කරමි. ගතවුනු අවුරුදු .... තුල ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායකව පැවතුණි. අංක 2/88. හා 1988.01.20...... දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ඔහු/ඇය ශ්‍රී ලං.ප.සේ. II/I ශ්‍රේණියට උසස්වීමක් ලැබීමට සුදුසුකම් ලබා තිබේ.

අමුණා ඇති ලිපියේ සඳහන් හේතූන් මත මෙම ඉල්ලීමට ඉඩ දිය නොහැකිය.

( නොගැලපෙන වචන කපා හරින්න )

..............................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

පදවි නාමය :-

දිනය :-

## III වන කොටස

............................................................ මහතා/මහත්මිය/මෙනෙවිය ශ්‍රී ලං.ප.සේ.
II/I ශ්‍රේණියට උසස් කිරීමට සුදුසුකම් ලබා ඇත.

උසස් කිරීම නිර්දේශ කරමි.

අත්සන.

ලේකම්,

අමාත්‍යාංශය,